සැ. යු.-2009.05.29 දින පළ කරන ලද අංක 1,604 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,605 - 2009 ජුනි මස 05 වැනි සිකුරාදා - 2009.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 732 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 739 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ජුනි මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 මැයි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යත්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,

# තනතුරු – ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාස වල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 ජුලි මස 03 වැනි දින හෝ එදිනට පෙර උපලේඛණයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 මැයි මස 06 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *අයදුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | කල්පිටිය | නොරොච්චෝලේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| පුත්තලම | කල්පිටිය | පල්ලිවාසල්තුරේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | -එම- |

06-30

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

## ආධුනික බටහිර තූර්ය වාදක පොලිස් කොස්තාපල්/ ආධුනික බටහිර තූර්ය වාදක කාන්තා පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ආධුනික බටහිර තූර්ය වාදක පොලිස් කොස්තාපල්/බටහිර තූර්ය වාදක කාන්තා පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබයි.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, පළමු මහල, නො. 375, හැව්ලොක් පාර, කොළඹ 06 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින් ඔබ අයදුම්කරන තනතුර "ආධුනික බටහිර තූර්ය වාදක පොලිස් කොස්තාපල්/බටහිර තූර්ය වාදක කාන්තා පොලිස් කොස්තාපල් තනතුර" යනුවෙන් සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2009.08.06 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය.-* රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2,160 - 17 x 2,880 - රු. 2,54,100

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ :

(අ) *විශේෂ දුෂ්කර දීමනා.-*

| | | |
|---|---|---|
| (1) | මෙහෙයුම් කලාපවල සේවය සඳහා | රු. 1,200 |
| (2) | මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා | රු. 600 |

(ආ) *සංයුක්ත දීමනා.-*

| | | |
|---|---|---|
| (1) | මෙහෙයුම් කලාපවල සේවය සඳහා සම්පූර්ණ සංයුක්ත දීමනාව | රු. 10,500 |
| (2) | මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා | රු. 3,500 |

(අ) නොමිලේ ගමන් පහසුකම්

(ආ) නිලධාරීන්ට/නිලධාරිණියන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(ඇ) සියලුම නිළ ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්

(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් දුෂ්කර සේවය හා විශිෂ්ඨ රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්.-*

(අ) *වයස් සීමාව* - ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතුය. එසේ වුව ද දැනට පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරියේ නියුතු

ආරක්ෂක සහායක නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කල හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* - අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුයි. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී එකවර විෂයයන් 05 කින් සමත් විය යුතුය.

*සැලකිය යුතුයි.-*

(අ) අ. පො. ස. (උ. පෙළ) විභාගය සමත් වී ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් සංගීතය විෂයය සමත් වී ඇති අයදුකරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

*සටහන 01* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂය අංක 41,44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයක් ලෙස ද අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයක් වශයෙන් ද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* අ. පො. ස. (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුලත් නොවන හෙයින්, එම විෂයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්.-*

(1) පොලිස් කොස්තාපල් තූර්ය වාදක :

උස අඩි 05 අඟල් 04 (අවම)
පපුව අඟල් 30යි. (අවම/හුස්ම නාල්ලා)

(2) කාන්තා පොලිස් කොස්තාපල් තූර්ය වාදක

උස අඩි 05 අඟල් 02 (අවම)

සටහන : විශිෂ්ඨ ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත්, ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩා වලදී විශිෂ්ඨත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද, අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *අවම වෘත්තීය සුදුසුකම්.-* රජයේ, හෝ රජයට අනුබද්ධ හෝ රජය පිළිගත් සංගීත ආයතනයකින් පහත පරිදි සංගීතය හදාරා පහත සඳහන් විභාගයෙන් සමත්වීම හෝ සංගීතය හදාරා ලබා ගන්නා ලද අවම මාස 06ක පාඨමාලා සහතිකයක් ලබා තිබීම.

(අ) බටහිර සංගීතය පිළිබඳ ලන්ඩන් රාජකීය විද්‍යාලයේ හෝ ට්‍රිනිටි සංගීත විද්‍යාලයේ විභාගයන් සමත්ව තිබීම; හෝ

(ආ) රජය පිළිගත් ආයතනයක බටහිර සංගීත විභාගයකින්; හෝ

(ඇ) රජය පිළිගත් ආයතනයක සංගීත පාඨමාලාවක් හදාරා තිබීම.

(ඉ) *අවම කුසලතා.-* පහත සඳහන් සංගීත භාණ්ඩ එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වාදනය කිරීමේ හැකියාව තිබිය යුතුයි.

* විශේෂිත වූ බටහිර සුසිර වාදන භාණ්ඩ වශයෙන් සැලකෙන ට්‍රම්පට්, ට්‍රොම්බෝන්, ඉයුපෝනියම්, බේස් ටියුබා, ප්‍රෙන්ච් හෝන්, ද ක්ලැරිනට්, සැක්සෆෝන්, ප්ලූට්, හාප් හා බැග් පයිප් ද, සයිඩ් ඩ්‍රම්, බේස් ඩ්‍රම්, සිම්බල්, ටිම්පනි වැනි භාණ්ඩ එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් වාදනය කිරීමේ හැකියාව හෝ තත් භාණ්ඩ, ස්වර පුවරු හා තාල තරංග, වාදන හැකියාව තිබිය යුතුවේ.

* මූලික පරීක්ෂණයෙන් පසුව කුසලතා පරීක්ෂා කිරීම සඳහා වෘත්තීමය පරීක්ෂණයක් ද අනතුරුව වාචික පරීක්ෂණයක් ද පවත්වනු ලැබේ.

(ඊ) *දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන්* - එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එයද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(උ) *අනෙක් සුදුසුකම්.-*

* අයදුම්කරුවන්/අයදුම්කාරියන් අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.)

* ඉහත දැක්වෙන මූලික අධ්‍යාපන හා ශාරීරික සුදුසුකම් ඇත්තා වූ ද, නියමිත වයස් සීමාව තුළ සිටින්නා වූ ද, අයදුම්කරුවන් /අයදුම්කාරියන් වෙත ක්‍රීඩා හා වෙනත් විශේෂ දක්ෂතා වේ නම් ඔවුන් පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

* අවසාන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වීමට ප්‍රථම අයදුම්කරුවන්/අයදුම්කාරියන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණය, ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ හැකියාව, පරීක්ෂා කිරීමේ පරීක්ෂණය සහ වෘත්තීමය පරීක්ෂණය, පැවැත්වෙනු ඇත.

* මූලික පරීක්ෂණයේ දී ශාරීරික සුදුසුකම් හා අධ්‍යාපන සහතික, වෘත්තීමය සහතික වල මුල් පිටපත් පරීක්ෂා කරනු ඇත.

* ඔරොත්තු දීමේ පරීක්ෂණයේ දී සෑම අයදුම්කරුවෙකුම මීටර් 1000 ක දුර ප්‍රමාණයක් මිනිත්තු 03 තත්පර 44 ක කාලයක් තුල නොකඩවා දිව අවසන් කළ යුතුය.

ඔරොත්තු දීමේ පරීක්ෂණයේ දී සෑම අයදුම්කාරියෙකුම මීටර් 1000 ක දුර ප්‍රමාණයක් මිනිත්තු 05 තත්පර 24ක කාලයක් තුළ නොකඩවා දිව අවසන් කළ යුතුය.

* වෘත්තීමය පරීක්ෂණයේ අවම ලකුණු 50%ක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට කැඳවනු ලැබේ.

* අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් අවම ලකුණු 40%ක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ ලකුණු වෘත්තීමය පරීක්ෂණයේ ලකුණු සමග එකට එකතු කර ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුවක් සකස් කර පුරප්පාඩු ගණන අනුව අවම ලකුණු ප්‍රමාණය තීරණය කරනු ඇත.

05. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.-* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 07/2007 අනුව 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීනතාවක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබා ගත යුතුය.

2007.07.01 දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

පත්වීමේ දින සිට වසර 05ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවනතාව ලබා නොගන්නා නිළධාරින්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

06. *පත්වීමේ කොන්දේසි.-* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

07. *සේවා කොන්දේසි.-*

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවෙනි සහ දෙවෙනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාටද යටත් විය යුතුය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකු/නිලධාරිණියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරින් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් 11 අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 දින පොලිස්පති චක්‍ර ලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 දින එම චක්‍ර ලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන්/අයදුම්කාරියන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ අතර මෙම සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04ට අනුකූල විය යුතුය.

(උ) තූර්ය වාදක පොලිස් කොස්තාපල්/කාන්තා පොලිස් කොස්තාපල්වරියන් පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍ර ලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) තූර්ය වාදක පොලිස් කොස්තාපල්/කාන්තා පොලිස් කොස්තාපල්වරියන් පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍ර ලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

(එ) තූර්ය වාදක පොලිස් කොස්තාපල්/කාන්තා පොලිස් කොස්තාපල්වරියන් පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

08. (අ) මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

09. අයදුම්කරුවන්/අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍ර වලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.)

(අ) උප්පැන්න සහතිකය
(ආ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන)
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඈ) අවම වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතිකවල ඡායා පිටපත්
(ඉ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික
(ඊ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්)
(උ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්

10. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන්/අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතුය.

(ආ) අයදුම්කරු/අයුම්කාරියන් විසින් අයදුම්පත් අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාළ සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු/නිලධාරිණියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

11. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.-* පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ජයන්ත වික්‍රමරත්න,
පොලිස්පති.

## පොලිස් දෙපාර්තමේන්තුව

බටහිර තූර්ය වාදක පොලිස් කොස්තාපල්/කාන්තා පොලිස් කොස්තාපල් තනතුර තූර්ය වාදක

### ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදි ම විය යුතුය. :————.
    (ආ) නම (මුලකුරු සමඟ) :————.
    (ඇ) ස්ත්‍රී/පුරුෂභාවය :————.
02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
03. පියාගේ සම්පූර්ණ නම :————.
04. අයදුම්කරු උපන් ස්ථානය :————.
    උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :————.
05. (අ) වර්තමාන ලිපිනය :————.
    (ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
    (ඇ) ස්ථිර ලිපිනය :————.
    (ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය :————.
06. (අ) ජාතිය :————.
    (ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.
    (ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :

    * අයදුම්කරු/අයදුම්කාරිය :————.
    * අයදුම්කරුගේ/අයදුම්කාරියගේ පියා :————.
    * අයදුම්කරුගේ/අයදුම්කාරියගේ පිය පක්ෂයේ මුත්තා :————.
    * අයදුම්කරුගේ/අයදුම්කාරියගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි.) :————.
    *වයස.- (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට)*

    අවුරුදු :————, මාස :————, දින :————.

08. උස අඟල් :————.

09. (1) අධ්‍යාපන සුදුසුකම් (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.) :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. (අ) දැනට කරන රැකියාව :————.
    (ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකාවක් ද? :————.

12. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද? :————.

13. අයදුම්කරු/අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

    (අ) ————.
    (ආ) ————.

14. (අ) ඔබ පොලිස් සේවයේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම්කර තිබේ ද? :————.
    (එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න)

    (ආ) ඔබ මීට පෙර පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද? :————.

    එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :————.

15. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

    (ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුනන්න. :————.

16. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

    (ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

17. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

18. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද? :————.

    එසේම කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ?

    එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

06-21

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ විද්‍යුත් ඉංජිනේරු ශාඛාවේ ඉඳුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීමට පිරිමි අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*විද්‍යුත් ඉංජිනේරු ශාඛාව :*

(අ) විද්‍යුත් හා විදුලි සංනිවේදන විද්‍යාවේදී උපාධියක් හෝ විද්‍යුත් හා විදුලි සංනිවේදන පිළිබඳව ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්ඩීටී) හෝ විද්‍යුත් ඉංජිනේරු පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී. ඊ.) හෝ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද තාක්ෂණ ඩිප්ලෝමාව (විද්‍යුත්/විදුලි සංඥා ඉංජිනේරු) හෝ ඉංජිනේරු විද්‍යාව (විද්‍යුත්/විදුලි සංඥා ඉංජිනේරු) පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම; හෝ

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යුත් හා විදුලි සංඥා ඉංජිනේරු හෝ පරිගණක ඉංජිනේරු විෂය මාලාව සම්පූර්ණ කර තිබිය යුතුය. (උපාධි පාඨමාලාව ඉතා හොඳින් සම්පූර්ණ කර ඇති බව සහ උපාධි ප්‍රධානෝත්සවයට පෙනී සිටීමට සූදානමින් සිටින බව සනාථ කෙරෙන සහතිකයක් අදාල විශ්ව විද්‍යාලයකින් ලබා ගත යුතුය.)

3. *අනෙකුත් සුදුසුකම් :*

(අ) *පුරවැසිභාවය :* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය;
(ආ) *සිවිල් තත්වය :* විවාහක සහ අවිවාහක;
(ඇ) *වයස :* 2009 ජූලි මස 20 වැනි දිනට වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය;
(ඈ) *උස :* අඩි 5 අඟල් 5 ක් හෝ ඊට වැඩි විය යුතුය;
(ඉ) *බර :* ශරීර ස්කන්ධ දර්ශකය $\frac{\text{බර (කි.ග්‍රෑ)}}{\text{උස (මී)}^2} < 25$;
(ඊ) *පපුව :* අඟල් 32ට නොඅඩු විය යුතුයි. (පිරිමි);
(උ) *වර්ණ දෘෂ්ටිය :* සීපී 2;
(ඌ) *දෘෂ්ටි තීක්ෂණත්වය :* වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහිතව හෝ රහිතව).

4. යම් අයදුම්කරුවෙකුට වයස හෝ උස නියමිත සුදුසුකම් නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ඨ දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා අවශ්‍යතා* :— තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද අනුව ගුවන් හමුදාවේ ප්ලයිට් ඔෆිසර්/ප්ලයිට් ලෙප්ටිනන්ට් යන නිලයන් හි නිත්‍ය අධිකාරියට පත්කරනු ලැබේ.

9. තෝරාගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේය.

10. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

11. 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව "සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක." කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳි ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේ නම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

12. ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුවද යවනු ලැබීමට යටත් වේ.

13. අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහ භාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

14. විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15(ආ)(15) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

15. (අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ :

ෆ්ලයිට් ඔෆිසර් - රු. 275,220 - 34 x 7,740 - රු. 538,380 වසරකට
ෆ්ලයිට් ලෙප්ටිනන් - රු. 321,660 - 28 x 7,740 - රු. 538,380 වසරකට
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 352,620 - 24 x 7,740- රු. 538,380 වසරකට
විංග් කමාන්ඩර් - රු. 362,100 - 20 x 9,480- රු. 551,700 වසරකට
ගෲප් කැප්ටන් - රු. 441,060 -18 x 12,600 - රු. 667,860 වසරකට

(ආ) *අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව ප්ලයිට් ඔෆිසර් සහ ඉන් ඉහල නිලයන්ට රු. 4,500 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට රු. 5,000ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,000ක් යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 100 0 බැගින් ගෙවනු ලැබේ.).
(6) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255ක් ගෙවනු ලැබේ.
(7) බැටිමන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).
(8) ආහාර දීමනාව මසකට රු. 9,839.70ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).
(9) සුදුසුකම් වේතනය අදාල පරිදි (මසකට උපරිමය රු. 637.50ක්) ගෙවනු ලැබේ.
(10) නොමිලේ ගමන් කළහැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/බිරිඳ/සහ දරුවන්ට) දෙනු ලැබේ.
(11) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(12) නිල ඇඳුම් හා ඊට අදාල අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(13) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදාල පරිදි).
(14) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30ක් තුල රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
(15) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමි වේ. පයිලට් ඔපිසර් සිට ගෲප් කැප්ටන් සහ ඊට ඉහල නිළයන් සඳහා මසකට රු. 1,600 සිට රු. 4,250 දක්වා.

16. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.*—විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. *ඉල්ලුම්කරුවන්ට උපදෙස්.*—

(*අ*) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2009 ජූනි මස 12 වැනි දින මධ්‍යාහ්න 12.00ට හෝ ඊට පෙර ලැබෙන සේ "ප්‍රධාන ආධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ "විද්‍යුත් ඉංජිනේරු ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(*ආ*) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

(*ඇ*) ඉල්ලුම්පත් සමග අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත් වල පිටපත් ඉදිරිපත් කළ යුතුය :

(1) උප්පැන්න සහතිකය;
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;
(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික;
(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදී සනාථ කරන සහතික;
(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

*සැලකිය යුතුයි.*- මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේ දී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමිවීමටද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වේ.

19. *තෝරාගැනීම සම්මුඛ පරීක්ෂණ ආදිය;*

(*අ*) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(*ආ*) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(*ඇ*) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය.

(*ඈ*) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(*ඉ*) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

(*ඊ*) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ………… ශාඛාවේ
අධිකාරියක් සඳහා ඉල්ලුම්පත

1. පුරවැසිභාවය :————. (ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ඉල්ලුම්කරන ශාඛාව :————.

5. ඉල්ලුම්කරන තනතුර :————.

6. ස්ථිර ලිපිනය :————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

8. තැපැල් ලිපිනය :————.

9. උපන් දිනය :————.

10. උස : අඩි :————. අඟල් :————.

11. දිස්ත්‍රික්කය :————.

12. ඡන්ද කොට්ඨාසය :————.

13. ග්‍රාම සේවක කොට්ඨාසය :————.

14. දුරකථන අංකය :————.

15. විවාහක හෝ අවිවාහක බව :————.

16. පාසැල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසැලේ/ විශ්වවිද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | |
| | අ.පො.ස. (උ.පෙළ) | | |
| | වෘත්තීය සුදුසුකම් | | |
| | වෙනත් | | |

17. පාසැලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත්වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :

| සේවායෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර :-

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැන් ලිපිනය |
|---|---|---|---|
| පියා :- | | | |
| මව :- | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

21. පාසැලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බළ සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

24. සිවිල් හෝ යුද්ධ උසාවියකදී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :

26. චරිත සහතික පිළිබඳ විස්තර :————.

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

27. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරී සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

06-102

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය**

තොරතුරු හා සන්නිවේදන

තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකපත්‍ර පාඨමාලාව

ආදර්ශ අයදුම්පත්‍රය 2009 ජූලි

| කාර්යාල ප්‍රයෝජනය | |
|---|---|

01. මුලකුරු සමඟ නම :———.
02. සම්පූර්ණ නම :———.
03. ස්ථිර ලිපිනය :———. දුරකථන අංකය :———.
04. පදිංචි ලිපිනය අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය :———.
05. ස්ත්‍රී පුරුෂභාවය :———.
06. උපන්දිනය : වර්ෂය :———. මාසය :———. දිනය :———.
07. 2009.06.22 දිනයට වයස අවු. :———. මාස :———. දින :———.
08. ජාතික හැඳුනුම්පත් අංකය :———. නිකුත් කළ දිනය :———.
09. පාඨමාලාව හැදෑරීමට අදහස්කරන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය

| *ආයතනය* | *මධ්‍යස්ථානය* |
|---|---|
| | |

10. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍යපෙළ)

*වර්ෂය* :———. *විභාග අංකය* :———.

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(ආ) අධ්‍යාපන පොදුසහතිකපත්‍ර (උසස්පෙළ)

වර්ෂය :———. විභාග අංකය :———.

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සත්‍ය බවත් මෙයින් සහතික කරන අතර මා තෝරාගැනීමෙන් පසු ඉහත සඳහන් කරුණු අසත්‍ය බව අනාවරණය වුවහොත් මාගේ ශිෂ්‍යභාවය අවලංගු වන බව දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික සහතික පත්‍ර පාඨමාලාව 2009 ජූලි මස පහත දැක්වෙන තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානවල ආරම්භ කිරීමට නියමිතය. මෙය පූර්ණකාලීන සයමාසික පාඨමාලාවක් වන අතර සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 6,000 වේ. පාඨමාලා ගාස්තුව වාරික වශයෙන්ද ගෙවිය හැකිය.

2. ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම්.

(i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍යපෙළ) විභාගයෙන් ගණිතය හා ඉංග්‍රීසි විෂයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයන් (6) කින් සමත්ව තිබීම.

*හෝ*

(ii) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදුසහතික පත්‍ර (සාමාන්‍යපෙළ) විභාගයෙන් ඕනෑම විෂයන් (4) හතරකට සම්මාන සමාර්ථ සහ ගණිතය හා ඉංග්‍රීසි විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ සහිතව විෂයන් (6) කින් සමත්ව තිබීම.

*හෝ*

(iii) දෙවරකට නොවැඩි වාරගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍යපෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් (3) තුනකට සම්මාන සාමාර්ථ සහ ගණිතය හා ඉංග්‍රීසි විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ සහිතව විෂයන් (06) කින් සමත්ව තිබීම සහ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස්පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් (02) දෙකකට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

වයස - 2009 ජූනි 22 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු හා 25ට නොවැඩි විය යුතුය.

3. පාඨමාලාව සඳහා තෝරාගැනීම
තෝරාගැනීම සිදුකරනුයේ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකින් සහ අනතුරුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකිනි.

4. පාඨමාලාව ක්‍රියාත්මක කිරීමට නියමිත මධ්‍යස්ථාන පහත දක්වා ඇත. ඔබ පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තුවන ආයතනය සහ අදාළ මධ්‍යස්ථානය අයදුම් පතේ සඳහන් කළ යුතුය.

5. අයදුම්පත් එවිය යුතු ආකාරය

5.1 අයදුම්පත මෙහි දක්වා ඇති ආකෘතිය අනුව A4 (8.4" x 11.8")ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර 2009 ජූනි මස 22 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ අයදුම් කරන මධ්‍යස්ථානයට ඉදිරියෙන් ඇති කොටුවේ සඳහන් ලිපිනයට යොමුකළ යුතුයි.

5.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික සහතික පත්‍ර පාඨමාලාව" යනුවෙන් සඳහන් කළ යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සහ
තොරතුරු තාක්ෂණ කමිටුව.

**වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පවත්නා මධ්‍යස්ථාන**

| | මධ්‍යස්ථානය | ලිපිනය |
|---|---|---|
| 01. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, පාදුක්ක | සහකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, කොළඹ දිස්ත්‍රික් කාර්යාලය, Y. M. B. A. ගොඩනැගිල්ල, සරණ පාර, වැලිකඩ, රාජගිරිය. |
| 02. | ජාතික වෘත්තීය පුහුණු ආයතනය, රත්මලාන | සහකාර අධ්‍යක්ෂක, ජාතික වෘත්තීය පුහුණු ආයතනය, නො. 100, කඳවල පාර, රත්මලාන |
| 03. | ජාතික වෘත්තීය පුහුණු ආයතනය, බද්දේගම | පුහුණු කළමණාකරු, ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මකුරුගොඩ පාර, බද්දේගම |
| 04. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ඇල්පිටිය | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් කාර්යාලය, ටැල්බට් ටවුම, ගාල්ල |
| 05. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, තවලම | |
| 06. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, යක්කලමුල්ල | |
| 07. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ඉමදූව | |
| 08. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ඌරවත්ත | |
| 09. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, හික්කඩුව | |
| 10. | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, පරමුල්ල, මාතර | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, පන්කාරාමය, පහ පීක්වැල්ල, මාතර |
| 11. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, Y. M. B. A. ගොඩනැගිල්ල, නුවර | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ගන්ඔරුව පාර, පේරාදෙනිය |
| 12. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කොටබෝගොඩ, කඩුගන්නාව | |
| 13. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙනිය | |
| 14. | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, වේයන්ගොඩ | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, වේයන්ගොඩ |
| 15. | නාලන්ද එල්ලාවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, තුඹගොඩ, බලන්ගොඩ | |
| 16. | දිස්ත්‍රික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ඉනාමලුව, දඹුල්ල | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ඉනාමලුව, දඹුල්ල |
| 17. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මින්නේරිය | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ඉනාමලුව, දඹුල්ල |
| 18. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ඇල්ල පාර, වැල්ලවාය | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, නිවාස අධිකාරිය පාර, මොනරාගල |
| 19. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ඉගිනියාගල පාර, අම්පාර | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, M A C F A ගාමන්ට්පැක්ටරි ගොඩනැගිල්ල, අක්කරෙයිපත්තු පාර, නින්දවූර් |
| 20. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කරෙයිතිව් | |
| 21. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, සයින්දමරුදු | |
| 22. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, අක්කරෙයිපත්තු | |
| 23. | දිස්ත්‍රික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, වන්දාරමුල්ල | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, වන්දාරමුලයි, මඩකලපුව |
| 24. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, එරාවූර් | |
| 25. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කල්අඩි | |
| 26. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කලවන්චිකුඩි | |
| 27. | දිස්ත්‍රික වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය, අඹේගොඩ, බණ්ඩාරවෙල | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් කාර්යාලය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, අඹේගොඩ, බණ්ඩාරවෙල |
| 28. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රොක්හිල්, බදුල්ල | |
| 29. | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මිරිජ්ජවිල, හම්බන්තොට | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, හේනකඩුව ශ්‍රී සුදර්ශනාරාමය, තංගල්ල |
| 30. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මැදමුලන | |
| 31. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රඹෑව, මිහින්තලේ | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, නුවර වැව පාර, අනුරාධපුර |

| *මධ්‍යස්ථානය* | *ලිපිනය* |
|---|---|
| 32. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කන්තලේ | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, නුවර වැව පාර, අනුරාධපුර |
| 33. ප්‍රාදේශීය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, නුවර වැව පාර, අනුරාධපුර | |
| 34. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, බල්ලපාන, ගලිගමුව | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, බල්ලපාන, ගලිගමුව. |
| 35. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, හොරණ | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, වැවල, හොරණ |
| 36. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කන්දෙවිහාරය | |
| 37. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, බිංගිරිය | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, සාරගම, කුරුණෑගල |
| 38. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය. මාරවිල | සහකාර අධ්‍යක්ෂක, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, හලාවත පාර, මාරවිල |
| 39. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", මැදවච්චිය | පළාත් අධ්‍යක්ෂක, "NAITA", උතුරු මැද පළාත් කාර්යාලය, 525/2,මෛත්‍රීපාල සේනානායක මාවත, දෙවන පියවර, රත්නායකපුර, අනුරාධපුරය |
| 40. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", පොළොන්නරුව | |
| 41. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", යාපනය | පළාත් අධ්‍යක්ෂක, "NAITA", උතුර පළාත් කාර්යාලය, නො. 07, පන්සල පාර, යාපනය |
| 42. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", වඩුක්කොඩායි | |
| 43. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", වවුනියාව | |
| 44. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", ත්‍රිකුණාමලය | පළාත් කළමණාකර, "NAITA", නැගෙනහිර පළාත් කාර්යාලය, නො. 07, ජී. එස්. මාවත, කල්මුනයිකුඩි-13, කල්මුනේ |
| 45. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", බදුල්ල | පළාත් කළමණාකරු, "NAITA", ඌව පළාත් කාර්යාලය, නො. 288, කුමාරසිංහ මාවත, පස්සර පාර, බදුල්ල |
| 46. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", ඇඹිලිපිටිය | පළාත් අධ්‍යක්ෂක, "NAITA", සබරගමුව පළාත් කාර්යාලය, පාසල් මාවත, නව නගරය, රත්නපුර |
| 47. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", මාවනැල්ල | |
| 48. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", යටියන්තොට | |
| 49. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "AETI", ඔරුගොඩවත්ත | අධ්‍යක්ෂක/විදුහල්පති, "AETI" 07, ඩැනිස්ටර් මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය |
| 50. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", මාතර | පළාත් අධ්‍යක්ෂක, "NAITA", දකුණු පළාත් කාර්යාලය, 27/ඒ, විවෘත විශ්ව විද්‍යාලය මාවත, නුපෙ, මාතර |
| 51. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", ඇල්පිටිය | |
| 52. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", කටුගස්තොට | පළාත් අධ්‍යක්ෂක, "NAITA", මධ්‍යම පළාත් කාර්යාලය, 108/2බී, තිවංකබෝධි මාවත, මහනුවර |
| 53. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", හැටන් | |
| 54. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", බේරුවල | පළාත් අධ්‍යක්ෂක, "NAITA", බස්නාහිර පළාත් කාර්යාලය, 242, හැව්ලොක් මාවත, කොළඹ 05 |
| 55. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", මාදම්පේ | පළාත් කළමණාකරු, "NAITA", උතුරු පළාත් කාර්යාලය, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල |
| 56. පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, "NAITA", ගල්ගමුව | |

**ජාතික තරුණ සේවා සභාව යටතේ ඇති මධ්‍යස්ථාන**

| *මධ්‍යස්ථානය* | *ලිපිනය* |
|---|---|
| 57. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ජාතික තරුණ සේවා මධ්‍යස්ථානය, මහරගම | මධ්‍යස්ථාන භාර නිලධාරි, ජාතික තරුණ මධ්‍යස්ථානය, 65, හයිලෙවල් පාර, මහරගම |
| 58. රිකිල්ලගස්කඩ තුරුණු සවිය මධ්‍යස්ථානය, නුවරඑළිය | මධ්‍යස්ථාන භාර නිලධාරි, රිකිල්ලගස්කඩ පුහුණු මධ්‍යස්ථානය, ජාතික තරුණ සේවා සභාව, රිකිල්ලගස්කඩ |

| මධ්‍යස්ථානය | ලිපිනය |
|---|---|
| 59. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කුරුණෑගල | මධ්‍යස්ථාන භාර නිලධාරි, දිස්ත්‍රික් කාර්යාලය, ජාතික තරුණසේවා සභාව, මල්කඩුවාව, කුරුණෑගල |
| 60. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මාකොළ | කළමනාකරු, කොරියා - ලංකා මිත්‍රත්ව පුහුණු කිරීමේ ආයතනය, ජාතික තරුණ සේවා සභාව, සපුගස්කන්ද, මාකොළ |
| 61. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, නාඋල | මධ්‍යස්ථාන භාර නිලධාරි, නාඋල පුහුණු මධ්‍යස්ථානය, ජාතික තරුණසේවා සභාව, අරංගල, නාඋල |
| 62. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, හලාවත | මධ්‍යස්ථාන භාර නිලධාරි, දිස්ත්‍රික් කාර්යාලය, ජාතික තරුණ සභාව, ආනන්ද මාවත, හලාවත |
| 63. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මොණරාගල | මධ්‍යස්ථාන භාර නිලධාරි, මොණරාගල පුහුණු මධ්‍යස්ථානය, ජාතික තරුණ සභාව, ප්‍රජා ශාලාව පාර, කච්චේරිය හන්දිය, මොණරාගල |
| 64. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කොබවක | මධ්‍යස්ථාන භාර නිලධාරි, කොබවක වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ජාතික තරුණ සේවා සභාව, කොබවක, ගෝවින්න |
| 65. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රත්මලාන | මධ්‍යස්ථාන භාර නිලධාරි, රත්මලාන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ජාතික තරුණ සේවා සභාව, ලලිත් ඇතුලත් මුදලි පුහුණු මධ්‍යස්ථානය, දුම්රියපළ පාර, රත්මලාන |
| 66. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, වව්නියාව | ස්ථානභාර නිලධාරි, වව්නියාව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ජාතික තරුණ සේවා සභාව, නුවර පාර, වව්නියාව. |

06-44/1

---

**වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය**

සිසුන් බඳවා ගැනීම - 2009 ජූලි

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව**

1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 2009 ජූලි මස පහත දැක්වෙන තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ ආරම්භ කිරීමට නියමිතය. මෙය පූර්ණකාලීන එක් අවුරුදු පාඨමාලාවක් වන අතර සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 20,000ක් වේ. පාඨමාලා ගාස්තුව වාරික වශයෙන් ද ගෙවිය හැකිය.

2. *ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම්.*- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික සහතික පත්‍ර ලාභියෙකු වීම. (NCICT)

*හෝ*

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය හා ඉංග්‍රීසි විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් (6)කින් සමත්වීම.

*හා*

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් තුනකින් සමත්වීම.

*හා*

පහත සඳහන් කොටස් අන්තර්ගත, ඕනෑම සය මාසික පූර්ණකාලීන තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාර තිබීම.

(i) පරිගණක මූලධර්ම (ඩොස්, වින්ඩෝස්, ජාලගත කිරීමේ මූලධර්ම, දෘඩාංග)

(ii) කාර්යාල ස්වයංකරණ (පද සැකසුම, පැතිරුම්පත්, සමර්පන මෘදුකාංග හා දත්ත සමුදය මෘදුකාංග)

(iii) අන්තර්ජාලය හා වෙබ් තාක්ෂණය

(iv) පද්ධති විශ්ලේෂණය හා සැලසුම් කිරීම

*වයස.*—2009 ජූනි 22 වන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුය.

3. තෝරාගැනීම සිදුකරනුයේ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකින් සහ අනතුරුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකිනි.

4. අයදුම්පත මෙහි දක්වා ඇති ආකෘතිය අනුව A4 (8.4" 11.3") ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර 2009 ජූනි මස 22 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ අයදුම් කරන මධ්‍යස්ථානයට ඉදිරියෙන් ඇති කොටුවේ සඳහන් ලිපිනයට යොමුකළ යුතුයි.

අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස උඩ කෙලවරේ "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව " යනුවෙන් සඳහන් කළ යුතුයි.

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සහ
තොරතුරු තාක්ෂණ කමිටුව.

| මධ්‍යස්ථානය | ලිපිනය |
|---|---|
| ජාතික තොරතුරු තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය, නාරාහේන්පිට | පුහුණු කළමණාකරු, ජාතික තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය 354, ඇල්විටිගල, මාවත, නාරාහේන්පිට, කොළඹ 05. |

*වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය*

*තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NDICT)*

ආදර්ශ අයදුම්පත්‍රය 2009 ජූලි

| කාර්යාල ප්‍රයෝජනය සඳහා | |
|---|---|

1. මුලකුරු සමග නම :————.
2. සම්පූර්ණ නම :————.
3. ස්ථිර ලිපිනය :————. දුරකථන අංකය :————.
4. පදිංචි ලිපිනය අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය :————.
5. ස්ත්‍රී පුරුෂ භාවය :————.
6. උපන්දිනය ෘ වර්ෂය :———, මාසය :———, දිනය :———.
7. 2009.06.22 දිනට වයස ෘ අවු. :———, මාස :———, දින :———.
8. ජාතික හැඳුනුම්පත් අංකය :————. නිකුත් කළ දිනය :————.
9. පාඨමාලාව හැදෑරීමට අදහස්කරණ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය :————.

| *ආයතනය* | *මධ්‍යස්ථානය* |
|---|---|
| | |

10. සයමාසික තොරතුරු තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාව හැදෑරූ මධ්‍යස්ථානය :————. (NCICT හෝ වෙනයම්)
11. විභාග අංකය (තිබේ නම්) :————. ලබාගත් සාමාර්ථය (තිබේ නම්) :————.
12. අධ්‍යාපන සුදුසුකම් ෘ

(අ) අධ්‍යාපන පොදුසහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ෘ

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, සත්‍ය බවත්, මෙයින් සහතික කරන අතර මා තෝරාගැනීමෙන් පසු ඉහත සඳහන් කරුණු අසත්‍ය බව අනාවරණය වුවහොත් මාගේ ශිෂ්‍ය භාවය අවලංගු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

06-44/2

---

**වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - රත්මලාන**

2009 II වන අර්ධ වර්ෂය සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම

පහත දැක්වෙන පාඨමාලා සඳහා ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *පා. අං.* | *පාඨමාලාව (පූර්ණ කාලීන)* | *පාඨමාලා කාලය ආයතනික පුහුණුව මාස* | *සැබෑ වැඩබිම් පුහුණුව* | *පාඨමාලා ගාස්තුව රු.* |
|---|---|---|---|---|
| 01. | ප්‍රමාණ සමීක්ෂණ (Quantity Surveyor) | 06 | 06 | 20,000 |
| 02. | කර්මාන්ත ශාලා උපකරණ කාර්මික ශිල්පී Industrial Instrument Technician (Industrial control | 12 | 12 | 12,000 |

| පා. අං. | පාඨමාලාව (පූර්ණ කාලීන) | පාඨමාලා කාලය ආයතනික පුහුණුව මාස | සැබෑ වැඩබිම් පුහුණුව | පාඨමාලා ගාස්තුව රු. |
|---|---|---|---|---|
| | Instrumentation and Automation (PLC Base) අන්තර්ගත පාඨමාලාවකි. | | | |
| 03. | පරිගනක යෙදුම් සහායක (Computer Application Assistant) NVQ Level - 03 | 06 | 06 | 4,000 |
| 04. | පරිගනක (දෘඩාංග) (Computer Hard wear TechnicianA+) NVQ Level - 03 | 06 | 06 | 10,000 |
| 05. | මෝටර් රථ වැද්දුම් ශිල්පී (Automobile Tinker) Level - 03 | 06 | 06 | නොමිලේ |
| 06. | ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික ශිල්පී (Aluminium Fabricator) Level 03 | 06 | 06 | 2,000 |
| 07. | කාර්යාල උපකරණ අළුත්වැඩියාව Office Equipment Repairer) | 12 | 12 | 5,000 |
| 08. | ජංගම දුරකථන අළුත්වැඩියාව (Mobile Phone Repairer) | 06 | 06 | 10,000 |
| 09. | යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පී (Wood Machinist) NVQ Level - 04 | 12 | 12 | නොමිලේ |
| 10. | ලේකම් පරිචය (Secretarial Practice) | 06 | 03 | 5,000 |
| 11. | තොරතුරු තාක්‍ෂණ සහතික පත්‍ර පාඨමාලාව (NCICT) | 06 | 06 | 6,000 |
| 12. | බහු විධි නිපුණතා ශිල්පී Multi skilled Craftsmen | 12 | 12 | 5,000 |

පූර්ණ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම්

* අයදුම්පත් ඉදිරිපත් කිරීමේ වයස් සීමාව අවුරුදු 16 - 30 අතර වේ.

*අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

* පාඨමාලා අංක 01 හා 02 සඳහා අ. පො. ස. (සා. පෙ.) ගණිත හා විද්‍යා විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර උ. පෙ. විද්‍යා හෝ ගණිත අංශයෙන් පෙනී සිට තිබීම විශේෂ සුදුසුකමක් වේ.

* පාඨමාලා අංක 03, 04, 10 සහ 11 සඳහා අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් 06කින් සමත්ව තිබිය යුතු අතර අංක 10 සහ 11 සඳහා උ. පෙ. විෂයයන් 02කින් සමත්ව තිබිය යුතුය.

* අනෙකුත් සියළුම පාඨමාලා සඳහා 9 ශ්‍රේණිය සමත්වීම හෝ අ. පො. ස. (සා. පෙ.) පෙනී සිටීම වුව ද ප්‍රමාණවත් වේ.

* අපේක්‍ෂකයාගේ දැනුම, ආකල්ප හා කුසලතා පදනම් කර ගෙන ඒ ඒ පාඨමාලා සඳහා අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කිරීම ද සලකා බලනු ලැබේ.

*ඉහත පාඨමාලා හදාරණ ඔබට, ඔබේ දරුවාට පුහුණු කාලය තුළ ලැබෙන පහසුකම් :*

* දුෂ්කර දුර බැහැර පෙදෙස්වල ආධුනිකයින් සඳහා නේවාසික පහසුකම්
* අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව
* රැකියා ලොව ඉහල පිළිගැනීමට ලක් වූ ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය නිපුණතා සහතිකය ( NVQ Level)
* වෘත්තීය මාර්ගෝපදේශනය සහ ව්‍යවසායකත්ව දැනුම
* ස්වයං රැකියා ආරම්භ කරන්නන් සඳහා ණය පහසුකම්
* සහනදායි මිලට ලංගම මගී වාර ප්‍රවේශ පත්‍ර
* නායකත්ව හා සෞඛ්‍ය පුහුණු වැඩසටහන්
* සෑම පාඨමාලාවකටම නොමිලේ ඉංග්‍රීසි අධ්‍යාපනය

**විශේෂයි :**

* සම්පූර්ණ පුහුණු පාඨමාලා කාලයෙන් මාස 06ක් රැකියා සම්බන්ධ පුහුණුව
* පුහුණුවෙන් පසු අනිවාර්යෙන්ම රැකියාවක්

* කාන්තා අයදුම්කාරියන් සඳහා ප්‍රමුඛත්වය
* දුර බැහැර පෙදෙස්වල අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය.

*පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම*

ඔබ හැදෑරීමට කැමති පාඨමාලාව සඳහන් කර ඔබේ පෞද්ගලික තොරතුරු, දක්‍ෂතා, රුචිකත්වයන් ඇතුල් කර ඔබ විසින්ම සකස් කරන ලද අයදුම්පතකි 2009.06.30 දිනට ප්‍රථම පහත ලිපිනයට යොමු කරන්න :

සහකාර අධ්‍යක්‍ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 100,
කඳවල පාර,
රත්මලාන.

දුරකථන අංක : 011-2638850

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

"ජීවිතයට හැකියාවක් - හැකියාවට රැකියාවක්"

06-88

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | **පිටපතක මිළ** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2009** | | | |
| ජූනි | 2009.06.05 | සිකුරාදා | 2009.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.12 | සිකුරාදා | 2009.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.19 | සිකුරාදා | 2009.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.26 | සිකුරාදා | 2009.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2009.07.03 | සිකුරාදා | 2009.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.10 | සිකුරාදා | 2009.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.17 | සිකුරාදා | 2009.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.24 | සිකුරාදා | 2009.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.31 | සිකුරාදා | 2009.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2009.08.07 | සිකුරාදා | 2009.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.08.14 | සිකුරාදා | 2009.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.08.21 | සිකුරාදා | 2009.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.08.28 | සිකුරාදා | 2009.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.